# University of Colombo
## Faculty of Science

**PO Box 1490, Colombo 3, SRI LANKA**

Office of the Dean


2016.12.21

ප්‍රිය ශිෂ්‍යය/ ශිෂ්‍යාවනි,

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් මම ඔබ සාදරයෙන් පිළිගනිමි.

විද්‍යා පීඨයේ නවක සිසුන් ලියාපදිංචි කිරීම 2017.01.05 දින විද්‍යා පීඨයේ තොරතුරු තාක්ෂණ ඒකකයේ දී සිදු කරනු ලබයි.

විද්‍යා පීඨයට බඳවා ගන්නා සිසුන් වෙනුවෙන් සංවිධානය කර ඇති කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය 2017.01.06 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 12.00 දක්වා විද්‍යා පීඨයේදී පැවැත්වේ. ඒ සඳහා පෙ.ව. 8.30 ට කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට පැමිණිය යුතු බව දන්වා සිටිමි. ඉංග්‍රීසි පාඨමාලාව සහ සිංහල/දෙමළ භාෂා පාඨමාලාව 2017.01.16 වන දින ආරම්භ වන අතර එදින සිට 2017.02.10 වන දින දක්වා පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 තෙක් අදාළ පාඨමාලාවන්ට සහභාගිවීම අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න

2017.01.06 වන දින පෙ.ව.10.00 සිට ප.ව 12.00 දක්වා විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමා, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසකතුමා සහ විද්‍යා පීඨ ශිෂ්‍ය අනුශාසකතුමා විසින් ඔබගේ දෙමාපියන් අමතනු ලබයි.

විද්‍යා පීඨ නවක සිසුන් සඳහා නම්නිකරණ පාඨමාලාව 2017.01.16 වන දින පෙ.ව. 9.00 ට විද්‍යා පීඨයේදී ආරම්භ වන අතර, එතැන් සිට ඔබ වෙනුවෙන් සංවිධානය කර ඇති සෑම ක්‍රියාකාරමක් සඳහාම ඔබේ සහභාගිත්වය අනිවාර්ය වේ. නම්නිකරණ පාඨමාලා කාලය තුළ ඔබට වෙන් කොට ඇති කාලසීමාවන් තුලදී අදාළ අධ්‍යයනාංශයන්හි ආචාර්යවරුන්, විශේෂයෙන් අධ්‍යයන උපදේශකවරුන් හමුවිය යුතුය. ඊට අමතරව ඔබට අවශ්‍ය තොරතුරු සැපයීම හා උපදෙස් ලබා දීම සඳහා සියලු ආචාර්යවරුන් අධ්‍යයනාංශවල රැඳී සිටිනු ඇත.

අධ්‍යයන කටයුතු සඳහා පළමු සමාසිකය 2017 පෙබරවාරි 13 වන සඳුදා දින පෙරවරු 8.00 ට ආරම්භ වේ. නම්නිකරණ පාඨමාලා කාලය තුල ඔබ වෙත ලබා දෙන විද්‍යා පීඨ ශිෂ්‍ය අත්පොතෙහි ඔබගේ අධ්‍යයන කටයුතු පිළිබඳ විස්තර ඇතුලත් වේ. කරුණාකර එය ප්‍රවේශමෙන් අධ්‍යයනය කරන මෙන් දන්වා සිටිමි. එමෙන්ම ඔබ වෙත ලබා දෙන අධ්‍යයන දින දර්ශනයෙහි වැදගත් දිනයන් වන අධ්‍යයන කාලසීමාවන්, විභාග සහ නිවාඩු ආදි දින පිළිබඳව දක්වා ඇත.

නේවාසිකාගාර පහසුකම් සඳහා හිමිකම් ලබන සිසුන් වෙත, ඒ බව යථා කාලයේදී ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සුභසාධක විසින් දන්වා එවනු ඇත.

ඔබට අවශ්‍ය වන අනෙකුත් ලියකියවිලි සමග ලිපියක් යථාකාලයේදී තැපැල් මගින් ලැබෙනු ඇත.

ඔබගේ විශ්වවිද්‍යාල ජීවිතය ඵලදායි සහ ප්‍රීතිමත් එකක් වේවා යයි පතමි.

මෙයට,

මහාචාර්ය කේ.ආර්.ආර්.මහානාම
පීඨාධිපති
විද්‍යා පීඨය

Prof. K. R. Ranjith Mahanama
Dean, Faculty of Science
University of Colombo
Colombo 3, Sri Lanka


Tel : +94 11 2503148, 011 2158300, +94 11 2586868, 011 2158332. Fax : 94 11 2503148
e-mail :dean@sci.cmb.ac.lk. Web:www.cmb.ac.lk